ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභියාචනාධිකරණයේ දීය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 138 වන ව්‍යවස්ථාවට අනුවද අධිකරණ සංවිධාන පනතේ 14 වන වගන්තියට අනුකූලව ද, අපරාධ නඩු විධාන සංග්‍රහයේ XXV111 පරිච්ඡේදයේ ප්‍රතිපාදනවලට සාරානුකූලව ද ඉදිරිපත් කරනු ලබන අභියාචන පෙත්සම පිළිබඳ කාරණයේ දීය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

පැමිණිල්ල

මහනුවර මහාධිකරණ

නඩු අංකය: රවි.සී.183/2007

-එදිරිව-

01. රාජපක්ෂ මුදියන්සේලාගේ නිහාල් රාජපක්ෂ

02. වීරද්දන මුදියන්සේලාගේ බාලසූරිය

චූදිතයින්

අභියාචනාධිකරණ

නඩු අංකය: සීඒ.293/ 2015

---

01. රාජපක්ෂ මුදියන්සේලාගේ නිහාල් රාජපක්ෂ
අංක.60 බී, දිඹුලගාවතැන්න, මැණික්හින්න

02. වීරද්දන මුදියන්සේලාගේ බාලසූරිය,
අංක. 5ඒ, උඩුගොඩ, වත්තේගම.

චූදිත-අභියාචකයන්

28 MAR 2019

එදිරිව

ගරු නීතිපතිතුමා,
නීතිපති දෙපාර්තමේන්තුව,
කොළඹ 12.

වගඋත්තරකරු

---

මධ්‍යම පළාත්බද මහනුවර මහාධිකරණ විනිසුරු තැන්පත්.
මේනකා විජේසුන්දර මැතිණිය ඉදිරිපිටදී ය.

සටහන් කලේ:- ල/ලේ එච්.ජ්.එස්. සංජීවනී අප්සරා විසිනි.

නඩු අංකය:-එච්.සී. 183/2007 දිනය:- 2015.12.03

# තීන්දුව.

මෙහි චූදිතයින්වන රාජපක්ෂ මුදියන්සේලාගේ නිහාල් රාජපක්ෂ සහ වරද්දත මුදියන්සේලාගේ බාලසූරිය යන අයවළුන් චෝදනා ලැබ තිබෙන්නේ,

01. වර්ෂ 2005 ක්වූ ජූලි මස 29 වන දින හෝ ඊට ආසන්න දිනයක දී මෙම අධිකරණ බල සීමාව තුළ පිහිටි වලලදී සහ වත්තේගමදී යුෂ්මතුන් ලියාපදිංචි අංක 141-6325 දරණ යතුරු පැදිය 01 වන සහ 02 වන චූදිතයින් විසින් භාරයට ගැනීම සම්බන්ධයෙන් විරුද්ධවීම හේතුවෙන් රෝහිත උපාසක ලියනගේ යන අයට එකී විරුද්ධවීම සම්බන්ධයෙන් දඬුවම් කිරීම සඳහා හා/හෝ එකී තැනැත්තා බිය ගැන්වීම සඳහා වධදුන් බැවින් යුෂ්මතුන් දණ්ඩ නීති සංග්‍රහයේ 32 වන වගන්තිය සමඟ කියවිය යුතු 1994 අංක 22 දරණ වධදීමට සහ අනෙකුත් කෲර අමානුෂික හෝ නින්දිත සැලකීමට හෝ දඬුවම්වලට එරෙහි වූ

ශ්‍රී ලංකා අභියාචනාධිකරණය
28 MAR 2019
කොළඹ - 12.

පනතේ 2(4) වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරද සිදු කල බවය.

02. වර්ෂ 2005 ක්වූ ජූලි මස 29 වන දින හෝ ඊට ආසන්න දිනයක දී මෙම අධිකරණ බල සීමාව තුල පිහිටි වලලදී සහ වත්තේගමදී යුෂ්මතුන් ලියාපදිංචි අංක 141-6325 දරණ යතුරු පැදිය 01 වන සහ 02 වන චූදිතයින් විසින් භාරයට ගැනීම සම්බන්ධයෙන් විරුද්ධවීම හේතුවෙන් ඒකනායක මුදියන්සේලාගේ සරත් බණ්ඩාර ඒකනායක යන අයට එකී විරුද්ධවීම සම්බන්ධයෙන් දඬුවම් කිරිම සදහා හා/හෝ එකී තැනැත්තා බිය ගැන්වීම සදහා වධදුන් බැවින් යුෂ්මතුන් දණ්ඩ නීති සංග්‍රහයේ 32 වන වගන්තිය සමග කියවිය යුතු 1994 අංක 22 දරණ වධදීමට සහ අනෙකුත් කෲර අමානුෂික හෝ නින්දිත සැලකීමට හෝ දඬුවම්වලට එරෙහි වූ පනතේ 2(4) වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදුකල බවය.

28 MAR 2019

මෙහිදී චූදිතයන් දෙදෙනාට දණ්ඩ නීති සංග්‍රහයෙහි 32 වන වගන්තිය පදනම් කරගෙන පලමු චෝදනාව ඉදිරිපත් කර ඇත්තේ වර්ෂ 2005 ක්වූ ජූලි මස 29 වන දින හෝ ඊට ආසන්න දිනයක දි

රෝහිත උපාසක ලියනගේ යන අයට කෲර ලෙස වධදීම සම්බන්ධයෙන් වේ.

දෙවනුව ඉදිරිපත් කර ඇත්තේ මෙම චූදිතයන් විසින්ම එකී දණ්ඩ නීති සංග්‍රහයෙහි 32 වන වගන්තිය පදනම් කරගෙන ඒකනායක මූදියන්සේලාගේ සරත් බණ්ඩාර ඒකනායක යන අයට කෲර වධහිංසාදීම සම්බන්ධයෙන් වේ.

මෙහි දී මෙම අදාල චෝදනා දෙක පිළිබඳව පැමිණිල්ලෙන් මෙම විත්තිකරුවන් පොදු චේතනාවක් පදනම් කරගෙන පැමිණිල්ලේ ඉහත සඳහන් පුද්ගලයන් දෙදෙනාට කෲර ලෙස වධහිංසා දුන් බවට සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කර පෙන්විය යුතු වේ. සාධාරණ සැකය යනු කුමක්ද යන්න ටී.එස්. ප්‍රනාන්දු විනිසුරුතුමා විසින් රජය එරෙහිව ජයවර්ධන **51 NLR 25** යන නඩුවේ දී සඳහන් කර ඇත. එනම් සාධාරණ සැකය යනු හුදෙක් අභව්‍ය යථාර්ථවාදී නොවන සැකයක් නොවන ප්‍රායෝගික යාථාර්ථවාදී සැකයක් වියයුතු බවයි.

28 MAR 2019
කොළඹ - 12

මෙම නඩුව මා ඉදිරියේ සම්පූර්ණයෙන්ම විභාග නොකරන ලදී. නමුත් දෙපාර්ශවයේම එකගත්වය මත මා ඉදිරියේ දී විත්තියේ නඩුව ආරම්භ කරන ලදී.

මෙහිදී පලමුවෙන්ම පැමිණිල්ලෙන් <u>රෝහිත උපාසක ලියනගේ</u> යන අයගේ සාක්ෂිය මෙහෙයවා ඇත. එම තැනැත්තාට අනුව ඔහු ඛණිජ තෙල් සංස්ථාවේ රැකියාවක් කරන අතර, මෙම සිද්ධිය සිදුවූ දින තමන් වලල ප්‍රදේශයේ බිරිදගේ නිවසේ සිටි බවත්, එසේ ගමන් කලේ යතුරු පැදියෙන් බවත්, එය මෙම නඩුවට අදාල යතුරුපැදිය බවටත් සදහන් කර ඇත. තමන් සමග තමන්ගේ දරුවා සහ බිරිද ගිය බවටත් සදහන් කර ඇත. මෙම නිවසේ භූමිය තුලට යතුරු පැදිය ගැනීමට නොහැකි නිසා ගෙදරට නගින පඩිපෙල ලග යතුරු පැදිය නතර කල බවටත් සදහන් කර ඇත. නමුත් තමන් යතුරු පැදිය නතර කරන ලද්දේ තමන්ගේ නැන්දම්මාගේ ඉඩම තුල බවට සදහන් කර ඇත. එම නතර කල ස්ථානයේ සිට පාරට අඩි 10ක් 12ක් පමණ තිබෙන බවටත් සදහන් කර ඇත. එම බයිසිකලය නතර කල ස්ථානයේ වටපිටාවේ ගෙවල් තිබෙන බවටත් සදහන් කර ඇත. ඉන්පසු තමන් තමන්ගේ මස්සිනා සමග තවත් ඥාතියෙකුගේ නිවසට වලල සිට මඩවල දෙසට ගිය බවත්, එම නිවසට ගොස් නැවත පැමිණෙන විට බයිසිකලය නැවැත් වූ තැන එය නොතිබූ බවටත් සදහන් කර ඇත. එම බයිසිකලය නැවැත් වූ පාර වලල සිට මඩවලට යන පාර බවටත් ඔහු සදහන් කර ඇත. තමන් බයිසිකලය සොයන

28 MAR 2019

විට ඉස්සරහා පැත්තෙන් බයිසිකලයක් පැමිණෙන ශබ්දයක් ඇසුණු බවත්, දෙදෙනෙ බයිසිකලය පදවාගෙන එතවා දුටු බවටත් සඳහන් කර ඇත. එවිට තමන්ලා කෑගසා බයිසිකලය නතර කරන ලෙසට කෑගැසූ නමුත් ඔවුන් බයිසිකලය නවත්වන්නේ නැතිව යන්න ගිය බවටත් සඳහන් කර ඇත. මෙම බයිසිකලේ යතුර තිබුණේ තමන් අත බවටත් සඳහන් කර ඇත. කෙසේ වෙතත් ඔවුන් බයිසිකලය නතර කළ විට තමන් ඔවුන් ලගට ගොස් බයිසිකලය ස්ටාර්ට් කලේ කොහොමද කියා ඇසූ බවටත් සඳහන් කර ඇත. එම අවස්ථාවේ ඔවුන් සිවිල් ඇඳුම් ඇඳ සිටි බවටත් සඳහන් කර ඇත. එම බයිසිකලයේ සිටි දෙදෙනා අද විත්ති කූඩුවේ සිටින බවටත් සඳහන් කර ඇත. එසේ තමන් බයිසිකලය ස්ටාර්ට් කලේ කෙසේද කියා ඇසූ විට ඔවුන් තමන්ට අසභ්‍ය වචනයෙන් බැන්න බවටත් සඳහන් කර ඇත. එවිට තමන් ඔවුන්ගෙන් බයිසිකල ඉල්ලූ බවත්, ඔවුන් බයිසිකලය නොදුන්න බවටත් ඊට පසු ඔවුන් බයිසිකලය පෙරලා යකඩ පොල්ලකින් ගැසූ බවත් සඳහන් කර ඇත. තමන්ට යකඩ පොල්ලෙන් තමන්ගේ දණහිසට, දණහිස පහළ කොටසට ගැසූ බවටත් සඳහන් කර ඇත. එසේ තමන්ගේ දණහිසට ගැසුවේ 1 වන විත්තිකරු බවටත් සඳහන් කර ඇත. තමන්ව හිරිවැටී වගේ එහෙමම පාරේ ඇදවැටුණ බවටත්

28 MAR 2019

සදහන් කර ඇත. ඉන්පසු තමන්ට නැගිටින්න බැරිවුණ බවටත්, අනෙක් පුද්ගලයා තමන්ගේ පිට හරහට පොල්ලෙන් ගැසූ බවටත් සදහන් කර ඇත. තමන්ගේ මස්සිනා බේරන්න හැදූ විට ඔහුටත් ගැසූ බවටත් සදහන් කර ඇත. ඉන්පසු එම ස්ථානයට ජීප් එකක් පැමිණි බවත්, එහි පොලිස් නිලධාරීන් සිටි බවටත් සදහන් කර ඇත. ඉන්පසු තමන්ව ජීප් එකට දාගත්ත බවටත්, තමන්ව ජීප් එකට දා ගත්තේ කකුලට පතුරක් තබා බවත්, තමන්ගේ කකුල කැඩිලා ගහන්න එපා කියා කෙනෙකු ඒ අවස්ථාවේ කෑගැසූ බවටත් සදහන් කර ඇත. තමන්ව වත්තේගම පොලිසියට රැගෙන ගොස් පැය ගණනාවක් තබා ගත් පසු එම්බියුලන්ස් එකක දමා පේරාදෙණිය රෝහලට එවූ බවටත් සදහන් කර ඇත. තමන් පේරාදෙණිය රෝහලේ අවුරුදු 2ට වඩා වැඩි කාලයක් ප්‍රතිකාර ලැබූ බවටත් සදහන් කර ඇත. මෙම පහරදීම නිසා තමන්ගේ කකුල කොට වී ඇවිදින්න අපහසු වී ඇති බවටත් සදහන් කර ඇත. තමන්ලා කිසිසේත්ම ඔවුන්ට පහර නොදුන් බවටත් ඔහු සදහන් කර ඇත.

මෙම සාක්ෂිකරුව හරස් ප්‍රශ්නවලට භාජනය කර ඇත. හරස් ප්‍රශ්න දීර්ඝ වශයෙන් අසා ඇති නමුත් බොහෝදුරට මෙම

සාක්ෂිකරුගෙන් අසා ඇත්තේ මූලික සාක්ෂිවලදී අසන ලද ප්‍රශ්නමය. මොහු හරස් ප්‍රශ්නවලදීත් කියා ඇත්තේ මෙම විත්තිකරුවන් දෙදෙනා බයිසිකලයෙන් පැමිණෙන විට සිවිල් ඇඳුමෙන් සැරසී සිටි බවය. මෙම සාක්ෂිකරු හරස් ප්‍රශ්නවලදී විත්තිකරුවන් සමග රණ්ඩුවක් ඇති නොවුන බවත්, තමන්ලා බයිසිකලය ආපසු ඉල්ලූ විට විත්තිකරුවන් ඔවුන්ට අසභ්‍ය වචනයෙන් බැන ඔවුන්ට පහර දුන් බවට සඳහන් කරන ලදී. මොහුට විත්තියෙන් යෝජනා කර ඇත්තේ මෙම සාක්ෂිකරු විත්තිකරුවන්ට පහර දුන් බවය. ඔහු එය තරයේ ප්‍රතික්ෂේප කර ඇත. මොහු තවදුරටත් හරස් ප්‍රශ්නවලදී ප්‍රකාශ කර ඇත්තේ බයිසිකලේ ලයිට් එළිය තිබුණ බවත්, එම ලයිට් එළියෙන් මෙම විත්තිකරුවන් හඳුනා ගත් බවත්, විත්තිකරුවන් දෙදෙනාම ඔහුට පහර දුන් බවය. එම සිද්ධිය සිදුවන අවස්ථාවේ දී ජීප් රථයක් පැමිණි බවටත් ඔහු සඳහන් කර ඇත. එසේම තවදුරටත් සඳහන් කළේ ජීප් රථයේ පැමිණි පිරිසත් ඔහුට හොඳටම පහරදුන් බවටත් සඳහන් කර ඇත. එයින් ඔහුගේ කකුල ඉතාමත් බරපතල ලෙස තුවාල වූ බවත්, කකුල ලීයක ගැටගසා ජීප් රථයට දමා ගත්ත බවටත් සඳහන් කර ඇත. ඒ අනුව මෙම සාක්ෂිකරුගෙන් දීර්ඝ වශයෙන් හරස් ප්‍රශ්න අසා ඇති වුවත් ඔහු මූලික සාක්ෂියේදී ගත්තා ලද ස්ථාවරයේ කිසිදු

28 MAR 2019

බිඳවැටීමක් සිදුනොවූ අතර, ඔහු මූලික සාක්ෂියේදී මෙන්ම හරස් ප්‍රශ්නවලදීත් තමන්ට මෙම විත්තිකරුවන් දෙදෙනාම ඉතාමත්ම බරපතල ලෙස පහර දුන් බවත්, ඒ අනුව තමන්ගේ කකුල ඉතාම බරපතල ලෙස තුවාල වූ බවටත් සඳහන් කර ඇත. එම ස්ථාවරයේ කිසිදු බිඳහෙළීමක් හරස් ප්‍රශ්නවලදී සිදුවී නොමැත. එසේම මෙම සාක්ෂිකරුගේ සාක්ෂියේදී තවත් විශේෂ කරුණක් හෙළිවූයේය. එනම් මෙම විත්තිකරුවන් දෙදෙනා රාජකාරි කටයුත්තක යෙදී සිටියත්, සාක්ෂිකරු මූලික සාක්ෂියේදීත්, හරස් ප්‍රශ්නවලදීත් සඳහන් කර සිටියේ විත්තිකරුවන් දෙදෙනාම එම අවස්ථාවේ සිවිල් ඇඳුමෙන් සැරසී සිටි බවය. එසේම මොහුගේ මූලික සාක්ෂියේදී ගන්නා ලද ස්ථාවරයන්වල කිසිදු සාධාරණ සැකයක් එම සාක්ෂියේදී මතුවී නොමැත.

ඉන්පසු පැමිණිල්ලෙන් තවදුරටත් සාක්ෂි අංක 2 වන ඒකනායක මුදියන්සේලාගේ සරත් බණ්ඩාර ඒකනායක යන අයගේ සාක්ෂිය මෙහෙයවා ඇත.

28 MAR 2010

මෙම සාක්ෂිකරු සඳහන් කර සිටියේ සාක්ෂි අංක 1 තමන්ගේ මස්සිනා බවත්, මෙම සිද්ධිය සිදුවූ දිනය වශයෙන් ඔහු 2005.07.28